# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**(101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2021 නොවැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 ඔක්තෝබර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[95 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ, පැහැර හැරීමක් සම්බන්ධයෙන් දෙන ලද නඩු තීන්දුව ඉවතලමින් හෝ ඉවත ලීම ප්‍රතික්ෂේප කරමින් කරන ලද යම් ආඥාවක් සම්බන්ධයෙන් වන විට දී, පළමුවෙන් අවසර ලබාගෙන පළාත්බද මහාධිකරණය වෙත අභියාචනාවක් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ. 29/2021

## (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2021 අංක     දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*101 වන අධිකාරයේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 88 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබේ:-

> "(2) පැහැර හැරීම සම්බන්ධයෙන් වාර්තාගත කරන ලද නඩු තීන්දුව අවලංගු කරනු ලබන හෝ අවලංගු කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන ආඥාව සමඟ එම ආඥාව කරනු ලබන්නේ යම් සිද්ධි විනිශ්චය කරමින් ද එම සිද්ධි සහ එම ආඥාව කරනු ලැබීමට පදනම් වූ හේතු ද නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන ඒ සඳහා අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබීමට ද එය යටත් විය යුතු ය.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.